| 7. | විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | සත්ත්ව සායනයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | කරවල, ලුණුමාළු හෝ ජාඩි කිලෝ ග්‍රෑම් 150 ට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම හෝ අඟුරු ගබඩාකර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | සත්ත්ව ආහාර නිපදවීම හෝ සත්ත්ව ආහාර ගබඩාවක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | පුන්නක්කු නිපදවීම හෝ කිලෝග්‍රෑම් 200 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | සබන් නිෂ්පාදනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | සත්ත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | අළුත් හෝ පරණ ලෝහ ගබඩා කර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | වේවැල් භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | සිරප් හෝ පළතුරු බීම වර්ග නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | රසකැවිලි වර්ග නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | පොල් ලෙලි පෙඟවීම (හෝ පල් කිරීම) | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | බුරුසු වර්ග නිපදවීම (දත් බුරුසු හැර) | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | දත් බුරුසු නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | රා එකතු කිරීම | 500 0 | 750 0 | 1,000 0 |

| අනු. අංකය | බලපත්‍රයේ ස්වභාවය | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 750.00 ට නොවැඩි වන විට රු. ශ. | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.750.00 ට වැඩි හා රු. 1,500.00 අඩු වන විට රු. ශ. | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.1,500.00 ට වැඩි වන විට රු. ශ. |
|---|---|---|---|---|
| 27. | විනාකිරි නිපදවීම හෝ ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් දුව ඉරීමේ ස්ථානයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් සායම් හෝ ඒවා ලීටර් 100 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | සෝඩා නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | සම් භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 32. | පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 33. | වී, මිරිස්, කෝපි, ධාන්‍ය වර්ග, මාෂභෝග, කුළුබඩු හෝ කිරිපිටි ඇඹරීම සඳහා ඇඹරුම් හලක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 34. | ඉටිපන්දම් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | කපුරු නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 36. | ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 37. | රෙදි සෝදන නිල් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 38. | ලාකඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 39. | සුවඳ විලවුන් නිපදවීම හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 40. | යෝගට් නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 41. | මස් සඳහා සතුන් මරණ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 42. | පාසල් රටහුණු නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 43. | ටයර් හෝ ටියුබ් 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 44. | ටයර්නැවත පිරවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 45. | ටයර් ටියුබ් වොල්කනයිස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 46. | සිමෙන්ති කිලෝ ග්‍රෑම් 1000 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 47. | සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 48. | ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 49. | යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 50. | පොහොර, හුණු පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 51. | යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 52. | ධාන්‍ය හෝ මාෂභෝග කිලෝග්‍රෑම් 250 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |

*දෙවන උපලෙඛනය - අන්තරාදායක පීඩාකාරී ව්‍යාපාර*

| | | | | |
|---|---|---|---|---|
| 1. | තොග වශයෙන් විකිණීම සඳහා හාල් පිටි, ලුණු හෝ සීනි කිලෝග්‍රෑම් 750 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | මැසූ ඇඳුම් නිෂ්පාදනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | මුද්‍රණාලයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | කුකුළන් 100 ට වැඩි ප්‍රමාණයක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | එළුවන්, ඌරන් 10 ට වැඩි ප්‍රමාණයක් සඳහා ගාලක් හෝ මඩුවක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | ගඩොල් හෝ උළු ගබඩා කර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | දර ගබඩාවක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | කළුගල් කැණීම හෝ කැඩීම යන්ත්‍රානුසාරයෙන් හෝ අතින් | 500 0 | 750 0 | 1,000 0 |

| අනු. අංකය | බලපත්‍රයේ ස්වභාවය | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 750.00ට නොවැඩි වන විට රු. ශත | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.750.00 ට වැඩි හා රු. 1,500.00ට අඩු වන විට රු. ශත | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.1,500.00ට වැඩි වන විට රු. ශත |
|---|---|---|---|---|
| 9. | සිසිල් බීම නිෂ්පාදනය හෝ සිසිල් බීම බෝතල් 100 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | අයිස්ක්‍රීම් නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | පොල්තෙල් නිෂ්පාදනය හෝ ලීටර් 300 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | ගිණි පෙට්ටි නිෂ්පාදනය සහ දුසිම් 100 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය හෝ ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අළුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හල් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | හිස් ගෝනි හෝ හිස් බෝතල් ගබඩා කර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | පාපැදි හෝ යතුරු පැදි අළුත්වැඩියා කිරීමේ වැඩපළක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර ගබාඩකර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | විසිරි පින්තාරු කිරීමේ ස්ථානයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම හෝ නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් ලීටර් 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | ශීතකළ මස් හෝ මාළු ගබඩාකර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | දුව ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |

*තෙවන උපලේඛනය - පීඩාකාරී හා අන්තරායදායක ව්‍යාපාර*

| | | | | |
|---|---|---|---|---|
| 1. | රසායනික ද්‍රව්‍ය පාවිච්චි කරන කුරුඳු, කරදමුංගු, එනසාල් හෝ කෙඳි කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 2. | ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම | 500 0 | 750 0 | 1,000 0 |
| 4. | විද්‍යුත් ලෝහ ආලේපනය කිරීමේ ස්ථානයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 5. | හුණුගල් හෝ හිරිගල් පිළිස්සීම, සකස් කිරීම හෝ අලුහුණු ගබඩාකිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 6. | බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 7. | මෝටර් වාහන අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 8. | මෝටර් වාහන සේවා කිරීමේ ස්ථානයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | වාත්තු මඩුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | ගෑස් සිලින්ඩර් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | ආයුර්වේද ඖෂධ, දේශීය ඖෂධ නිෂ්පාදනය කිරීම හෝ සංයෝජනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | වීදුරු භාණ්ඩ හෝ වීදුරු තහඩු ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | ප්ලාස්ටික් හෝ ෆයිබර් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ශාලාවක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | කිලෝග්‍රෑම් 150 ට වැඩියෙන් තේ කුඩු ගබඩාකර තබා ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | වැල්ඩින් සඳහා ස්ථානයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | ලියවන පට්ටලයක් භාවිතා කරමින් වැඩපළක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |

| අනු. අංකය | බලපත්‍රයේ ස්වභාවය | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු. 750.00ට නොවැඩි වන විට රු. ශ. | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.750.00 ට වැඩි හා රු. 1,500.00 අඩු වන විට රු. ශ. | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු.1,500.00 ට වැඩි වන විට රු. ශ. |
|---|---|---|---|---|
| 18. | පැට්‍රෝල්, ඩීසල්, තෙල් හෝ වෙනත් යම් ඛණිජ තෙල් වර්ගයක් ගබඩාකොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | කෘෂි රසායන ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | වායු සමන යන්ත්‍ර, ශීතකරණ හෝ අධිශීතකරණ සර්විස් කිරීම හෝ අළුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | විදුලි කර්මාන්ත වැඩපලක් හෝ විදුලි උපකරණ නිපදවන හෝ අළුත්වැඩියා කිරීමේ වැඩපළක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | කිරි ශීත කිරීමේ මධ්‍යස්ථානයක් පැවැත්වීම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | බේකරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | හෝටල් හෝ ලැගුම්හල් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | භෝජන ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | අවමංගල්‍ය සේවා සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

10-578/4

---

## මතුගම ප්‍රාදේශීය සභාව

### 2020 වර්ෂය සඳහා අක්කර බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (3) වන උපවගන්තියෙන් මතුගම ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව, මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද පහත උපලේඛනයේ විස්තර වන දේපළ සඳහා අක්කර බද්දක් පනවා අය කිරීමට 2019.09.02 දින රැස්වූ මහා සභා රැස්වීමේ දී යෝජනා අංක.5.1.5 යටතේ ඒකමතිකව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

2020 වර්ෂය සඳහා පනවන ලද අක්කර බද්ද මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, හා දෙසැම්බර් 31 වැනි දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළදී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බවත් වැඩිදුරටත් නිවේදනය කරමි.

මෙරිල් මුණසිංහ,
සභාපති,
මතුගම ප්‍රාදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 03 වන දින,
මතුගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියේ (3) වන උපවගන්තියෙන් මතුගම ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාර මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ ද ස්ථිර හා නිතිපතා ගොවිතැන් යටතේ වූ එක් එක් ඉඩම් හෙක්ටයාරය මත පහත දක්වා ඇති අනුප්‍රමාණ නොඉක්මවන අක්කර බද්දක් 2020 වර්ෂයට පනවා අය කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

| *ඉඩම් ප්‍රමාණය* | *අනු ප්‍රමාණය වර්ෂයකට* |
|---|---|
| ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර පහක් හෝ ඊට වැඩි අවස්ථාවක | රු. 10.00 |

2020 වර්ෂය සඳහා වන සම්පූර්ණ අක්කර බද්ද 2020 වර්ෂයේ ජනවාරි මස 31 දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද එක් එක් කාර්තුවකට අදාළ අක්කර බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයේ අවසන් දිනට මත්තෙන් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහක (5%) වට්ටමක් ද සභාව ලබා දිය යුතු බවටත් යෝජනා කරමි.

10-578/5

---

**මතුගම ප්‍රාදේශීය සභාව**

2020 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වගන්තියේ (1) වැනි උපවගන්තිය අනුව මතුගම ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි උපලේඛනයේ විස්තර කර ඇති ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර *නැතහොත්* නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු සංවර්ධනය නොකළ ඉඩමකට බද්දක් පනවා අය කිරීමට 2019.09.02 වැනි දින රැස්වූ මහ සභා රැස්වීමේ දී යෝජනා අංක 5.1.6 යටතේ ඒකමතිකව සභා සම්මත කරන ලදී. ඒ අනුව 2020.03.31 දිනට පෙර එම බද්ද මතුගම ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව මෙයින් නිවේදනය කරමි.

මෙරිල් මුණසිංහ,<br>
සභාපති,<br>
මතුගම ප්‍රාදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 30 වන දින,<br>
මතුගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 වැනි වගන්තියේ (I) වැනි උප වගන්තිය අනුව ප්‍රදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි ගොඩනැගිලි ඉදිකිරීමට හෝ ස්ථාවර *නැතහොත්* නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක,

*(අ)* ඒ ඉඩමෙහි ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම් හෝ,

*(ආ)* ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක, හෝ

*(ඇ)* ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවල ඇත්ත වශයෙන් ම යටවී ඇති බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ ඉඩම ඇති අනුපාතය 3.2 ට වඩා අඩු වන්නේ නම්,

එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම මත 2020 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ භූමියේ ප්‍රාග්ධන අගයෙන් 2%ක වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධන නොකළ ඉඩම් මත එකී බද්ද 2020 වර්ෂයේ මාර්තු 31 වැනි දිනට පෙර මතුගම ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවට ගරු සභාවට යෝජනා කරමි.

10-578/6

## මතුගම ප්‍රාදේශීය සභාව

2020 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත අනුව මතුගම ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල හා 1952 අංක 6 දරන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තියේ විධිවිධාන අනුව හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1947/6 හා 2015.12.28 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ සම්මත අතුරු ව්‍යවස්ථාවෙන් සභාව වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව, මතුගම සභා බල ප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා පහත දක්වා ඇති උපලේඛනයේ සඳහන් ගාස්තු පනවා අය කිරීමට 2019.09.02 දින රැස්වූ මහ සභා රැස්වීමේ දී යෝජනා අංක 5.1.7 යටතේ ඒකමතිකව සභා සම්මත කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙරිල් මුණසිංහ,<br>
සභාපති,<br>
මතුගම ප්‍රාදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 03 වැනි දින,<br>
මතුගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දීය.

### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 VII (ඊ) වගන්තියෙන් සභාව වෙත පැවරී ඇති බලතල හා 1952 අංක 6 දරන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තියේ විධිවිධාන අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1947/6 - 2015.12.28 දිනැති *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ සම්මත අතුරු ව්‍යවස්ථාවෙන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා පහත දක්වා ඇති උපලේඛනයේ ගාස්තු 2020 වර්ෂයට පනවා අය කළ යුතු බවට ගරු සභාවට යෝජනා කරමි.

ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමට අවසර ලබා ගැනීම සඳහා ඉල්ලුම්පතක් සභාවට ඉදිරිපත් කළ යුතු ය.

| | | *රු. ශත* |
|---|---|---|
| 01. | ඉල්ලුම්පතක ගාස්තුව | 100 0 |
| 02. | අනවසර ගාස්තුව (දිනකට) | 250 0 |

### *උපලේඛනය*

| *අනු. අංකය* | *පුවරුවේ ස්වභාවය* | *වර්ග මීටර් ප්‍රමාණය* | *ගාස්තුව (රු.)* | | |
|---|---|---|---|---|---|
| | | | *මාස 03 ට අඩු* | *මාස 03 හෝ 06 අතර* | *වසරක්* |
| 01 | කිසියම් බිත්තියක හෝ තාප්පයක ප්‍රචාරය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් | 1ට අඩු | 250.00 | 350.00 | 500.00 |
| | | 1ට වැඩි | 1ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200.00 බැගින් | | |
| 02 | රෙදි, ඩිජිටල් බැනර් සඳහා | 3ට අඩු | 250.00 | 350.00 | 500.00 |
| | | 3ට වැඩි | 3ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200.00 බැගින් | | |
| 03 | තහඩු හෝ දැව මගින් ප්‍රදර්ශනය කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා | 1ට අඩු | 500.00 | 750.00 | 1,000.00 |
| | | 1ට වැඩි | 1ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300.00 බැගින් | | |

| අනු. අංකය | පුවරුවේ ස්වභාවය | වර්ග මීටර් ප්‍රමාණය | ගාස්තුව (රු.) | | |
|---|---|---|---|---|---|
| | | | මාස 03 ට අඩු | මාස 03 හෝ 06 අතර | වසරක් |
| 04 | විදුලිය යොදා ක්‍රියාත්මක කරනු ලබන ප්‍රචාරක දැන්වීම් | 1ට අඩු | 500.00 | 750.00 | 1,000.00 |
| | | 1ට වැඩි | 1ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300.00 බැගින් | | |
| 05 | ඉටිරෙදි හෝ කාඩ්බෝඩ් මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා | 1ට අඩු | 250.00 | 350.00 | 500.00 |
| | | 1ට වැඩි | 1ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 300.00 බැගින් | | |
| 06 | ප්ලාස්ටික් පුවරු හෝ ෆයිබර් පුවරු මගින් කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා | 1ට අඩු | 250.00 | 350.00 | 500.00 |
| | | 1ට වැඩි | 1ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 200.00 බැගින් | | |
| 07 | විද්‍යුත් උපකරණ යොදා කරනු ලබන ප්‍රචාරක දැන්වීම් සඳහා | 1ට අඩු | 750.00 | 850.00 | 1,000.00 |
| | | 1ට වැඩි | 1ට වැඩි වන සෑම වර්ග මීටරයක් හෝ එයින් කොටසක් සඳහා රු. 500.00 බැගින් | | |

10-578/7

---

**මතුගම ප්‍රාදේශීය සභාව**

2020 වර්ෂය සඳහා ත්‍රීරෝද රථ නවතා තැබීමේ ස්ථාන සඳහා ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් මතුගම ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සහ 1952 අංක 6 දරන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තියේ විධි විධාන අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1947/6 - 2015.12.28 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ සම්මත අතුරු ව්‍යවස්ථාවෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව මතුගම සභා බල ප්‍රදේශය තුළ ත්‍රීරෝද නැවතුම්පොල නවතා තැබීම සඳහා ගාස්තු පනවා අය කිරීම 2019.09.02 දින රැස්වූ මහ සභා රැස්වීමේදී යෝජනා අංක 5.1.8 යටතේ ඒකමතිකව සභා සම්මත කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙරිල් මුණසිංහ,
සභාපති,
මතුගම ප්‍රාදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 03 වැනි දින,
මතුගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 VII (ඌ) වගන්තියෙන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 1952 අංක 6 දරන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තියේ විධි විධාන අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1947/6 - 2015.12.28 දිනැති ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ සම්මත අතුරු ව්‍යවස්ථාවෙන් සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ත්‍රීරෝද රථ නැවතුම්පල වල නවතා තැබීම සඳහා පහත උපලේඛනයේ සඳහන් ගාස්තු 2020 වර්ෂයට පනවා අය කල යුතු බවට ගරු සභාවට යෝජනා කරමි.

***උපලේඛනය***

| | | රු. ශත |
|---|---|---|
| 1. | ලියාපදිංචි කිරීමේ ගාස්තුව | 200 0 |
| 2. | වාර්ෂික නැවතුම් ගාස්තුව (එකවර ගෙවන විට) | 2,000 0 |
| 3. | වාර්ෂික නැවතුම් ගාස්තුව මසකට (මාසිකව ගෙවන විට) | 200 0 |
| 4. | සමිතියක ලියාපදිංචි කල රථගාල් (වාර්ෂිකව) | 5,000 0 |

10-578/8

## මතුගම ප්‍රාදේශීය සභාව

### 2020 වර්ෂය සඳහා ආදාහනාගාරය සඳහා ගාස්තු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ මතුගම ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හා 1952 අංක 6 දරන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තියේ විධිවිධාන අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1947/6 - 2015.12.28 දිනැති ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ සම්මත අතුරු ව්‍යවස්ථාවෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව මතුගම ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරය සඳහා පහත උපලේඛනයේ ගාස්තුව පනවා අය කිරීමට 2019.09.02 දින රැස්වූ මහ සභා රැස්වීමේදී යෝජනා අංක 5.1.9 යටතේ ඒකමතිකව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

මෙරිල් මුණසිංහ,
සභාපති,
මතුගම ප්‍රාදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 03 දින,
මතුගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

#### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 127 වගන්තිය යටතේ සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 1952 අංක 6 දරන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තියේ විධි විධාන අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1947/6 - 2015.12.28 දිනැති ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ සම්මත අතුරු ව්‍යවස්ථාවක් සභාව වෙත පැවරී බලතල ප්‍රකාරව මතුගම ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරය සඳහා පහත උපලේඛනයේ සඳහන් අවසර පත්‍ර ගාස්තු 2020 වර්ෂයට අය කළ යුතු බවත් ගරු සභාවට යෝජනා කරමි.

| *අනු අංකය* | *ආවරණ කලාපය* | *මුදල* |
|---|---|---|
| | | *රු. ශත* |
| 01. | මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල (එක් මෘත ශරීරයක් සඳහා) | 5,500 0 |
| 02. | මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත (එක් මෘත ශරීරයක් සඳහා) | 8,000 0 |

10-578/9

---

## මතුගම ප්‍රාදේශීය සභාව

### 2020 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන සහතික, සපයනු ලබන සේවාවන් සහ වෙනත් ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ මතුගම ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හා 1952 අංක 6 දරන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තියේ විධිවිධාන අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1947/6 - 2015.12.28 දිනැති ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ සම්මත අතුරු ව්‍යවස්ථාවෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව මතුගම ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරය සඳහා පහත උපලේඛනයේ සඳහන් ගාස්තු පනවා අය කිරීමට 2019.09.02 දින රැස්වූ විශේෂ මහ සභා රැස්වීමේදී යෝජනා අංක 5.1.10 යටතේ ඒකමතිකව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

මෙරිල් මුණසිංහ,
සභාපති,
මතුගම ප්‍රාදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 03 වැනි දින,
මතුගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

#### යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (XIV) වගන්තියෙන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 1952 අංක 6 දරන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තියේ විධි විධාන අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1947/6-2015.12.28 දිනැති *ගැසට් පත්‍රයේ* පලකරනු ලැබූ සම්මත අතුරු ව්‍යවස්ථාවෙන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පහත උපලේඛනයේ I තීරුවේ සඳහන් සහතිකයන් හෝ සේවාවන් සැපයීම සඳහා එම උපලේඛනයේ II තීරුවේ ඒ ඒ සහතිකයන් හෝ සේවාවන් සැපයීම වෙනුවෙන් සඳහන් කර ඇති ගාස්තුව 2020 වර්ෂයට පනවා අය කළ යුතු බවත්, එකී සේවාව හෝ සහතිකය ලබා ගන්නා යම් තැනැත්තෙකු විසින් ඒ සේවාව හෝ සහතිකය ලබා ගැනීමට පෙර එම ගාස්තුව මතුගම ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවත් ගරු සභාවට යෝජනා කරමි.

| I | II | රු. ශත |
|---|---|---|
| 1. | ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම | 200 0 |
| | ඉල්ලුම් පත්‍ර ගාස්තුව | 250 0 |
| | අනවසර ගාස්තුව (දිනකට) | |
| 2. | සංචාරක වෙළඳාම් කිරීම | |
| | අවසර පත්‍ර ගාස්තුව | 1,500 0 |
| 3. | උද්ධෘත නිකුත් කිරීම | |
| | වරිපනම් ලේඛනවල උද්ධෘතයක් ලබාදීම | 1,000 0 |
| | වරිපනම් දැන්වීමේ උද්ධෘතයක් ලබාදීම | 500 0 |
| 4. | පෝරම නිකුත් කිරීම | |
| | පෙර පාසල් අයදුම්පත්‍රයක් සඳහා | 200 0 |
| | ගොඩනැගිලි අයදුම්පත්‍රයක් සඳහා | 1,000 0 |
| | ඉඩම් අනුබෙදුම් අයදුම්පත්‍රයක් සඳහා | 1,000 0 |
| | වරිපනම් ලේඛනයේ නම වෙනස් කිරීමේ අයදුම්පත්‍රයක් සඳහා | 500 0 |
| | අනතුරුදායක ගස් ඉවත් කිරීමේ අයදුම්පත්‍රයක් සඳහා | 1,000 0 |
| | ක්‍රීඩා භූමිය පරිහරණයට අවසර ලබා ගැනීමේ අයදුම්පත්‍රයක් සඳහා | 250 0 |
| 5. | පුස්තකාල ගාස්තු | |
| | පුස්තකාල සාමාජික ගාස්තු | 100 0 |
| | සාමාජිකත්වය අළුත් කිරීම | 50 0 |
| | අයදුම්පත් ගාස්තුව | 10 0 |
| | ඇප තැන්පතු ගාස්තුව (බල ප්‍රදේශයෙන් පිටත) පාසල්ළමුන් රජයේ නිලධාරීන් | 500 0 |
| | සේවා ගාස්තු (බල ප්‍රදේශයෙන් පිටත විශේෂ සාමාජික ගාස්තු) | 2,000 0 |
| | විශේෂ සාමාජික ගාස්තු අළුත් කිරීම | 100 0 |
| | පුස්තකාල ප්‍රමාද ගාස්තු දිනකට ගාස්තු | 1.00 |

| 6. | සහතික නිකුත් කිරීම | ඉල්ලුම්පත්‍ර ගාස්තුව රු. ශත | සහතිකය සඳහා ගාස්තුව රු. ශත |
|---|---|---|---|
| | වීථි රේඛා සහතිකය | 100 0 | 500 0 |
| | නොපවරා ගැනීමේ සහතිකය | 100 0 | 500 0 |
| | දේපල හිමිකම් සහතිකය | 100 0 | 500 0 |

7. සභාව සතු භූමි කුලියට දීම

| අනු අංකය | ක්‍රීඩාංගණයේ නම | ගාස්තුව | තැන්පත් මුදල | අතිරේක ගාස්තුව |
|---|---|---|---|---|
| 1. | යටදොලවත්ත එල්. ජී. ලියනආරච්චි ක්‍රීඩාංගණය | රු. ශත | රු. ශත | රු. ශත |
| අ. | ක්‍රිකට් ක්‍රීඩාංගණය සඳහා දිනකට | | | |
| | බල ප්‍රදේශයේ අනුමත ක්‍රීඩා සමාජ සඳහා | 3,000 0 | 3,000 0 | |
| | පෞද්ගලික ආයතනවලට | 7,500 0 | 4,000 0 | |
| | රාජ්‍ය ආයතනවලට | 1,500 0 | 2,000 0 | |
| | පාසල් සඳහා | 500 0 | 1,000 0 | |
| | පැති විකට්ටු සඳහා (දිනකට) | 250 0 | | |

| | | | රු. ශත | රු. ශත | රු. ශත පැයකට |
|---|---|---|---|---|---|
| | ආ. | බැඩ්මින්ටන් ක්‍රීඩාගාරය සඳහා (දිනකට) | 2500 | 2,000 | 250 0 |
| | ඇ. | රාත්‍රී සේවය ලබාගැනීම සඳහා සාමාජිකයින් සඳහා ලියාපදිංචි ගාස්තුව (මාසික) | | | |
| | | තරගාවලි සඳහා (දිනකට) | 500 0 | 2,500 0 | |
| | ඈ. | වොලි බෝල් ක්‍රීඩාංගණය තරගාවලි සඳහා (දිනකට) | 500 0 | 2,500 0 | |
| | ඉ. | ශරීර සුවතා මධ්‍යස්ථානය සඳහා | | | |
| | | ඇතුල්වීමේ ගාස්තුව | 500 0 | | |
| | | මාසික ගාස්තුව පිරිමි | 1,000 0 | | |
| | | ගැහැණු | 500 0 | | |
| 2. | | මතුගම මහජන ක්‍රීඩාංගණය | | | |
| | අ. | ක්‍රීඩා තරග සඳහා | | | |
| | | පාසල් | 500 0 | 300 0 | |
| | | ක්‍රීඩා සමාජ | 1,000 0 | 2,000 0 | |
| | | පුහුණු කඳවුරු | 2,000 0 | 2,000 0 | |
| | | පුහුණු කඳවුරු (රාජ්‍ය ආයතන) | 1,000 0 | 2,000 0 | |
| | ආ. | දේශපාලන රැස්වීම් සඳහා (දිනකට) | 7,500 0 | 5,000 0 | |
| | ඇ. | සංගීත සංදර්ශන සඳහා | | | |
| | | රාජ්‍ය ආයතන | 5,000 0 | 10,000 0 | |
| | | නොමිලයේ පැවැත්වෙන (ටිකට් රහිත) | 10,000 0 | 10,000 0 | |
| | ඈ. | සංගීත සංදර්ශන | | | |
| | | රාජ්‍ය ආයතන(ටිකට් රහිත) | 10,000 0 | 10,000 0 | |
| | | ගාස්තු අයකර (ටිකට් සහිත) | 15,000 0 | 10,000 0 | |
| | ඉ. | සැණකෙලි සඳහා දිනකට | | | |
| | | රාජ්‍ය ආයතන | 5,000 0 | 10,000 0 | |
| | | වෙනත් | 20,000 0 | 20,000 0 | |
| 3. | | ශ්‍රවණාගාරය | | | |
| | අ. | නාට්‍ය සංගීත සංදර්ශන සඳහා හා ප්‍රදර්ශන වැඩමුළු | 15,000 0 | 3,000 0 | |
| | ආ. | සේල් සඳහා | 20,0000 | 10,000 0 | |
| | ඇ. | සම්මන්ත්‍රණ, දේශන (පුද්ගලික) | 7,500 0 | 3,000 0 | |
| | ඈ. | අධ්‍යාපන සම්මන්ත්‍රණ (විදුහල් සඳහා) | 5,000 0 | 3,000 0 | |
| | ඉ. | මංගල උත්සව සඳහා ආසන | 12,000 0 | 3,000 0 | |
| | ඊ. | දේශපාලන රැස්වීම් සඳහා | 10,000 0 | 3,000 0 | |
| | උ. | සහන මිල වැඩකරන දිනකට | 3,500 0 | 3,000 0 | |
| | | නිවාඩු දිනකට | 4,500 0 | 3,000 0 | |
| | | ශබ්ද විකාශන යන්ත්‍ර | 3,500 0 | | |
| | | ශ්‍රවණාගාර මිදුල | 5,000 0 | | |
| | ඌ. | සුසානභූමි සඳහා ගාස්තු (භූමිදානයක් සඳහා) | 250 0 | | |
| | එ. | බල ප්‍රදේශයේ ඉඩම් වෙන්දේසිකරුවන් ලියාපදිංචි කිරීම සඳහා එක් වර්ෂයක් සඳහා ලියාපදිංචි කිරීමේ ගාස්තුව | 10,000 0 | | |

**මතුගම ප්‍රාදේශීය සභාව**

2020 වර්ෂය සඳහා වාහන හා සත්ත්ව බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 හා 148 වන වගන්තිවලින් මතුගම ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2020 වර්ෂයේදී පහත උපලේඛනයෙහි I වන තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙක්ම එහි II වන තීරුවේ සඳහන් අනුප්‍රමාණයක වාහන හා සත්ත්ව බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අය කිරීමට 2019.09.02 දින රැස්වූ මහ සභා රැස්වීමේදී යෝජනා අංක 5.1.11 යටතේ ඒකමතිකව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

මෙරිල් මුණසිංහ,
සභාපති,
මතුගම ප්‍රාදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 03 දින,
මතුගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 හා 148 වන වගන්ති වලින් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2020 වර්ෂයේදී පහත උපලේඛනයෙහි I වන තීරුවේ සඳහන් කිසියම් වාහනයක් හෝ සතෙකු තමා සන්තකයේ තබා ගන්නා සෑම තැනැත්තෙකුම එහි II වන තීරුවේ සඳහන් අනුප්‍රමාණයක වාහන හා සත්ත්ව බද්දක් 2020 වර්ෂය සඳහා පනවා අයකිරීමටත් එකී වාහන හා සත්ව බද්දට යටත් තැනැත්තෙකුම විසින් එකී වාහනය හෝ සතා තමන් භාරයේ තබා ගන්නා දින තිහක් සම්පූර්ණ වූ වහාම 2020 වර්ෂය සඳහා වන මෙම බද්ද ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවටත් ගරු සභාවට යෝජනා කරමි.

*උපලේඛනය*

| | *I වන තීරුව* | *II වන තීරුව* |
|---|---|---|
| (i) | මෝටර් රථයක්, මෝටර් ලොරියක්, මෝටර් ට්‍රයිසිකලයක්, කරත්තයක්, බයිසිකලයක් හෝ ජින් රික්ෂෝවක්, නොවන සෑම වාහනයක් සඳහා | රු. 25 0 |
| (ii) | සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ බයිසිකල් කරත්තයක් සඳහා | |
| | (අ) වෙළඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම් | 18 0 |
| | (ආ) වෙළඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම් | 04 0 |
| (iii) | සෑම කරත්තයක් සඳහා | රු. 20 0 |
| (iv) | සෑම අත්කරත්තයක් සඳහා | රු. 10 0 |
| (v) | සෑම රික්ෂෝවක් සඳහා | රු 7.50 |
| (vi) | සෑම අශ්වයෙකු,පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා | රු 15 0 |
| (vii) | සෑම ඇතෙකුම සඳහා | රු. 50 0 |

(2) විශ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද සහිත ළමා වාහන, විල් බැරෝ, හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්යය සඳහා යොදවන අත් කරත්ත සහ වෙළඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත ඉහත ගෙවීමෙන් නිදහස් කෙරේ.

10-578/11

## මතුගම ප්‍රාදේශීය සභාව

### 2020 වර්ෂය සඳහා සංචාරක වෙළඳාම් කිරීම් සඳහා ගාස්තු අය කිරීම පිළිබඳ යෝජනාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ මතුගම ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 1952 අංක 6 දරන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තියේ විධි විධාන අනුව හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1947/6 - 2015.12.28 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ සම්මත අතුරු ව්‍යවස්ථාවෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සංචාරක වෙළඳාම කිරීම සඳහා අවසර පත්‍ර ගාස්තුවක් 2020 වර්ෂයට පනවා අය කිරීමට 2019.09.02 දින රැස්වූ මහා සභාරැස්වීමේදී යෝජනා අංක 5.1.12 යටතේ ඒකමතිකව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

මෙරිල් මුණසිංහ,
සභාපති,
මතුගම ප්‍රාදේශීය සභාව.

2019 සැප්තැම්බර් මස 03 දින,
මතුගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (x) වගන්තියෙන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 1952 අංක 6 දරන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තියේ විධිවිධාන අනුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1947/6 - 2015.12.28 දිනැති *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ සම්මත අතුරු ව්‍යවස්ථාවෙන් සභාව වෙත ලැබී ඇති බලතල ප්‍රකාරව මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සංචාරක වෙළඳාම් කිරීම සඳහා අවසර පත්‍ර ගාස්තුව 2020 වර්ෂයට රු. 1500.00 ක් පනවා අය කළ යුතු බව ගරු සභාවට යෝජනා කරමි.

10-578/12

---

## මාතර මහා නගර සභාව

### උයන්වත්ත ක්‍රීඩාංගනය බාහිර පාර්ශවයන්ට ලබා දීමේදී 2019 වර්ෂයේ සිට අය කරන සංශෝධිත ගාස්තු පැනවීම

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 252 වැනි අධිකාරිය යටතේ මහා නගර සභා ආඥපනත මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව මහා නගර සභා ආඥපනතේ 251 අ (1) වගන්තිය ප්‍රකාරව උයන්වත්ත ක්‍රීඩාංගනය පහත උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් ස්ථානයන් හා කාර්යයන් සම්බන්ධයෙන් බාහිර පාර්ශවයන්ට ලබාදීමේදී මාතර මහා නගර සභාවට අය විය යුතු ගාස්තුව ඉහත කී උපලේඛනයේ ඉදිරියෙන් ඇති දෙවන තීරයේ සඳහන් සංශෝධිත ගාස්තු අනුප්‍රමාණයන්ගෙන් යුක්තව 2019 වර්ෂයේ සිට අය කිරීමට 2018.10.11 දින පැවති මහා සභාව විසින් තීරණ අංක 2018/මා.මනස/මුදල් ප්‍ර./126 යටතේ ඒකමතිකව සම්මත කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩී. ජී. යසරත්න,
නගරාධිපති,
මහා නගර සභාව,
මාතර.

**උපලේඛනය**

| *පළමු වන තීරය* | | *දෙවන වන තීරය මුදල (රු.)* |
|---|---|---|
| පාසල් | ක්‍රීඩා මණ්ඩපය | 1,000.00 |
| වාණිජ කටයුතු | ක්‍රීඩා මණ්ඩපය | 7,000.00 |
| සම්මන්ත්‍රණ | ක්‍රීඩා මණ්ඩපය | 3,000.00 |
| තණ නිල්ල සහිත ක්‍රීඩාංගන පාසල් | | 4,000.00 |

| *පළමු වන තීරය* | *දෙවන වන තීරය මුදල (රු.)* |
|---|---|
| තණ නිල්ල සහිත ක්‍රීඩාංගන ක්‍රීඩා සමාජ | 8,000.00 |
| තණ නිල්ල සහිත ක්‍රීඩාංගන පාසල් (නගර සීමාවෙන් පිට) | 4,000.00 |
| තණ නිල්ල සහිත ක්‍රීඩාංගන ක්‍රීඩා සමාජ (නගර සීමාවෙන් පිට) | 8,500.00 |
| මණ්ඩපය සමඟ ක්‍රීඩාංගනය (සැහැල්ලු පන්දු, අවුරුදු උත්සව, නෙට්බෝල්, වෙනත්) | 6,000.00 |
| තණ නිල්ල සහිත ක්‍රීඩාංගන (ජාත්‍යන්තර පාසල්) විදේශ ක්‍රිකට් කණ්ඩායම් තණ නිල්ල සමඟ | 15,000.00 |
| සැහැල්ලු පන්දු පාසල් සඳහා මණ්ඩපය ද සමඟ | 2,500.00 |
| රාජ්‍ය ආයතන නගර සීමාව තුළ | 4,000.00 |
| රාජ්‍ය ආයතන නගර සීමාවෙන් පිට | 5,000.00 |
| බැංකු නගර සීමාව තුළ (මණ්ඩපය සමඟ) | 12,000.00 |
| බැංකු නගර සීමාවෙන් පිට (මණ්ඩපය සමඟ) | 15,000.00 |
| පෞද්ගලික ආයතන (මණ්ඩපය සමඟ) නගර සීමාව තුළ | 12,000.00 |
| පෞද්ගලික ආයතන (මණ්ඩපය සමඟ) නගර සීමාවෙන් පිට | 15,000.00 |
| තැන්පතු | 2,500.00 |

10-619/1

---

**මාතර මහා නගර සභාව**

සනත් ජයසූරිය ක්‍රීඩාංගනය බාහිර පාර්ශවයන්ට ලබා දීමේදී 2019 වර්ෂයේ සිට අය කරන සංශෝධිත ගාස්තු පැනවීම

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 252 වැනි අධිකාරිය යටතේ මහා නගර සභා ආඥාපනත මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව මහානගර සභා ආඥාපනතේ 251 අ (1) වගන්තිය ප්‍රකාරව සනත් ජයසූරිය ක්‍රීඩාංගනය පහත උපලේඛනයේ පළමුවන තීරයේ සඳහන් ස්ථානයන් හා කාර්යයන් සම්බන්ධයෙන් බාහිර පාර්ශවයන්ට ලබාදීමේදී මාතර මහා නගර සභාවට අය විය යුතු ගාස්තුව ඉහත කී උපලේඛනයේ ඉදිරියෙන් ඇති දෙවන තීරයේ සඳහන් සංශෝධිත ගාස්තු අනුප්‍රමාණයන්ගෙන් යුක්තව 2019 වර්ෂයේ සිට අය කිරීමට 2018.10.11 දින පැවති මහා සභාව විසින් තීරණ අංක 2018/මා.මනස/මුදල් ප්‍ර./127 යටතේ ඒකමතිකව සම්මත කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩී. ජී. යසරත්න,
නගරාධිපති,
මහා නගර සභාව,
මාතර.

**උපලේඛනය**

| *පළමු වන තීරය* | *දෙවන තීරය මුදල (රු.)* |
|---|---|
| පාසල් සඳහා (ක්‍රිකට්) | 2,000.00 |
| ක්‍රීඩා සමාජ (සැහැල්ලු පන්දු) | 4,000.00 |
| තැන්පතු | 3,000.00 |
| සාමාන්‍ය රැස්වීමක් සඳහා | 5,000.00 |
| රජයේ මැදිහත්වීම මත පවත්වන වෙළඳ ප්‍රදර්ශන සඳහා | 7,000.00 |
| ඒ සඳහා තැන්පතු | 5,000.00 |
| වෙනත් ප්‍රදර්ශන සඳහා | 12,000.00 |
| ඒ සඳහා තැන්පතු | 10,000.00 |
| සැණකෙළි / සංදර්ශන දිනකට (පුද්ගලික අංශය) | 1,25,000.00 |
| තැන්පතු | 35,000.00 |
| රජය හා රජයට අනුබද්ධ ආයතන | |
| සැණකෙළිය පැවැත්වෙන මුල් දිනය සඳහා | 40,000.00 |
| පළමු දිනයට පසුව සැණකෙළිය පැවැත්වෙන සෑම දිනයක් සඳහාම දිනකට | 25,000.00 |
| සැණකෙළිය පැවැත්වෙන දිනට පෙර සූදානම් වීමේ දිනය සඳහා (අවශ්‍ය සවිකිරීම් හා වෙනත් සූදානම්) | 10,000.00 |
| සැණකෙළිය පැවැත්වූ පසු ඉවත් කර ගැනීමේ කටයුතු සඳහා එක් දිනකට | 10,000.00 |
| තැන්පතු | 50,000.00 |
| දේශපාලන රැස්වීමක් සඳහා | 5,000.00 |

10-619/2

## දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව

### උත්සව ශාලා වෙන් කිරීමේ ගාස්තු සංශෝධනය 2019

**ගල්කිස්ස බඩෝවිට 05 වන අදියර උත්සව ශාලාව**

දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව විසින් 2019.08.06 වන දින පවත්වන ලද ක්‍රීඩා, සුභසාධනය, සංස්කෘතික, විනෝද, පූර්ව ළමා විය සංවර්ධනය, අධ්‍යාපන සංවර්ධනය, ප්‍රජා සේවා හා පොදු කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුවේ නිර්දේශය 2019.08.29 වන දින පවත්වනු ලැබූ මහ සභාවේ තීරණ අංක 07(VI) 02 (VII) යටතේ, සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

නාවලගේ ස්ටැන්ලි ඩයස්,
නගරාධිපති.

2019 සැප්තැම්බර් මස 30 වැනි දින,
දෙහිවල ගල්කිස්ස මහ නගර සභා කාර්යාලයේ දී ය.

*යෝජනාව*

දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ ක්‍රීඩා දෙපාර්තමේන්තුව යටතේ ඇති ගල්කිස්ස බඩෝවිට 05 වන අදියර උත්සව ශාලාව වෙන් කිරීමේ දී අය කරනු ලබන ගාස්තු පහත සඳහන් ආකාරයට විය යුතු බවට දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව යෝජනා කරයි.

*බඩෝවිට උත්සව ශාලාව*

**අයකිරීම් සම්බන්ධව විස්තරය**

**2019**

| අංකය | විස්තරය | පැය ගණන | මුදල රු. | NBT 2% රු. | VAT 15% රු. | මුළු මුදල රු. | තැන්පත් මුදල රු. |
|---|---|---|---|---|---|---|---|
| 01 | සම්මන්ත්‍රණ (අධ්‍යාපන හා වෙනත්) | 08 | 5,000.00 | 100.00 | 765.00 | 5,865.00 | 7,500.00 |
| 02 | පුහුණු පංති පාසල්/වෙනත් | 08 | 2,500.00 | 50.00 | 382.50 | 2,932.50 | 7,500.00 |
| 03 | මංගල උත්සව | පෙ.ව. 8.00 - ප.ව. 5.00 ප.ව. 1.00 - 10.00 | 4,000.00 | 80.00 | 612.00 | 4,692.00 | 7,500.00 |
| 04 | උපන්දින සාදයකට | පෙ.ව. 8.00-ප.ව.5.00 ප.ව. 1.00. -10.00 | 3,500.00 | 70.00 | 535.50 | 4,105.50 | 7,500.00 |
| 05 | විවිධ ආකාරයේ සුහද හමු සඳහා | පෙ.ව. 8.00 - ප.ව. 5.00 ප.ව. 1.00- 10.00 | 5,000.00 | 100.00 | 765.00 | 5,865.00 | 7,500.00 |

10-528/2

## දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව

### උත්සව ශාලා වෙන් කිරීමේ ගාස්තු සංශෝධනය - 2019

**එස්. ද. එස්. ජයසිංහ සමරු උත්සව ශාලාව**

දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව විසින් 2019.08.20 වන දින පවත්වන ලද මුදල් කටයුතු පිළිබඳ ස්ථාවර කමිටුවේ නිර්දේශය 2019.08.29 වන දින පවත්වනු ලැබූ මහ සභාවේ තීරණ අංක 07 (x) 72 යටතේ සහා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

නාවලගේ ස්ටැන්ලි ඩයස්,
නගරාධිපති.

2019 සැප්තැම්බර් මස 30 වැනි දින,
දෙහිවල ගල්කිස්ස මහ නගර සභා කාර්යාලයේ දී ය.

**යෝජනාව**

දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ ක්‍රීඩා දෙපාර්තමේන්තුව යටතේ ඇති එස්. ද. එස්. ජයසිංහ සමරු ශාලාව වෙන් කිරීමේ දී අයකරනු ලබන ගාස්තු පහත සඳහන් ආකාරයට විය යුතු බවට දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව යෝජනා කරයි.

**2020**
**සතියේ දින**

A ශාලාව (ශ්‍රවණාගාරය)

| | විස්තරය | උපරිම පැය | අවම කුලිය (රු.) | NBT 2% (රු.) | VAT 15% (රු.) | මුදල (රු.) | තැන්පත් මුදල (රු.) | මුළු මුදල (රු.) | වැඩිවන පැයකට(රු.) | NBT 2% (රු.) | VAT 15% (රු.) | මුදල (රු.) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | නාට්‍ය චිත්‍රපට මුදල් අයකර පවත්වන විවිධ ප්‍රසංග | | | | | | | | | | | |
| | 1. දර්ශන එකකට | 04 | 25,000.00 | 500.00 | 3,825.00 | 29,325.00 | 50,000 | 79,325.00 | 6,250.00 | 125.00 | 956.25 | 7,331.25 |
| | 2. දර්ශන දෙකකට | 08 | 35,000.00 | 700.00 | 5,355.00 | 41,055.00 | 50,000 | 91,055.00 | 4,375.00 | 87.50 | 669.37 | 5,131.87 |
| | 3. දර්ශන තුනකට | 12 | 45,000.00 | 900.00 | 6,885.00 | 52,785.00 | 50,000 | 1,02,785.00 | 3,750.00 | 75.00 | 573.75 | 4,398.75 |
| 02 | සංගීත සංදර්ශන | 04 | 40,000.00 | 800.00 | 6,120.00 | 46,920.00 | 100,000.00 | 146,920.00 | 10,000.00 | 200.00 | 1,530.00 | 11,730.0 |
| | | 08 | 60,000.00 | 1,200.00 | 9,180.00 | 70,380.00 | 100,000.00 | 170,380.00 | 7,500.00 | 150.00 | 1,147.50 | 8,797.50 |
| | | 12 | 80,000.00 | 1,600.00 | 12,240.00 | 93,840.00 | 100,000.00 | 193,840.00 | 6,666.66 | 133.33 | 1019.99 | 7,819.98 |
| 03 | අධ්‍යාපන හෝ වෙනත් සම්මන්ත්‍රණ | 04 | 20,000.00 | 400.00 | 3,060.00 | 23,460.00 | 50,000.00 | 73,460.00 | 5,000.00 | 100.00 | 765.00 | 5,865.00 |
| | | 08 | 30,000.00 | 600.00 | 4,590.00 | 35,190.00 | 50,000.00 | 85,190.00 | 3,750.00 | 75.00 | 573.75 | 4,398.75 |
| 04 | පාසල් ළමුන්ගේ සහභාගීත්වයෙන් පවත්වනු ලබන විවිධ ප්‍රසංග නාට්‍ය දර්ශන | 04 | 15,000.00 | 300.00 | 2,295.00 | 17,595.00 | 30,000.00 | 47,595.00 | 3,750.00 | 75.00 | 573.75 | 4,398.75 |
| | | 08 | 25,000.00 | 500.00 | 3,825.00 | 29,325.00 | 30,000.00 | 59,325.00 | 3,125.00 | 62.50 | 478.13 | 3,665.63 |

| | විස්තරය | උපරිම පැය | අවම කුලිය (රු.) | NBT 2% (රු.) | VAT 15% (රු.) | මුදල (රු.) | තැන්පත් මුදල (රු.) | මුළු මුදල (රු.) | වැඩිවන පැයකට(රු.) | NBT 2% (රු.) | VAT 15% (රු.) | මුදල (රු.) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 04 | ළදරු පාසල් උත්සව | 04 | 20,000.00 | 400.00 | 3,060.00 | 23,460.00 | 30,000.00 | 53,460.00 | 5,000.00 | 100.00 | 765.00 | 5,865.00 |
| 05 | රාජ්‍ය ආයතන පවත්වනු ලබන සම්මන්ත්‍රණ/උත්සව | 04 | 15,000.00 | 300.00 | 2,295.00 | 17,595.00 | 30,000.00 | 47,595.00 | 3,750.00 | 75.00 | 573.75 | 4,398.75 |

*සැ. යු.*- සියලුම අයකිරීම්වල දී පෙර පුහුණු කටයුතු සඳහා අදාළ ශාලා ගාස්තුවෙන් අඩක් අය කළ යුතු ය.
(වායු සමීකරණ පහසුකම් රහිත ව පැය 04 කට සීමා වේ.)

**2020**
**සතිඅන්ත දින හා රජයේ නිවාඩු දින**

A ශාලාව (ශ්‍රවණාගාරය)

| | විස්තරය | උපරිම පැය | අවම කුලිය (රු.) | NBT 2% (රු.) | VAT 15% (රු.) | මුදල (රු.) | තැන්පත් මුදල (රු.) | මුළු මුදල (රු.) | වැඩි වන පැයකට (රු.) | NBT 2% | VAT 15% (රු.) | මුදල (රු.) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | නාට්‍ය, චිත්‍රපටි මුදල් අයකර පවත්වන විවිධ ප්‍රසංග | | | | | | | | | | | |
| | 1.දර්ශන එකකට | 04 | 35,000.00 | 700.00 | 5,355.00 | 41,055.00 | 50,000.00 | 91,055.00 | 8,750.00 | 175.50 | 1,338.75 | 10,263.75 |
| | 2.දර්ශන දෙකකට | 08 | 45,000.00 | 900.00 | 6,885.00 | 52,785.00 | 50,000.00 | 102,785.00 | 5,625.00 | 112.00 | 860.63 | 6,398.13 |
| | 3. දර්ශන තුනකට | 12 | 60,000.00 | 1,200.00 | 9,180.00 | 70,380.00 | 50,000.00 | 120,380.00 | 5000.00 | 100.00 | 765.00 | 5,865.00 |
| 02 | සංගීත සංදර්ශනය | 04 | 50,000.00 | 1,000.00 | 7,650.00 | 58,650.00 | 100,000.00 | 158,650.00 | 12,500.00 | 250.00 | 1,912.50 | 14,662.50 |
| | | 08 | 75,000.00 | 1,500.00 | 11,475.00 | 87,975.00 | 100,000.00 | 187,975.00 | 9,375.00 | 187.50 | 1,434.38 | 10,996.88 |
| | | 12 | 100,000.00 | 2,000.00 | 15,300.00 | 117,300.00 | 100,000.00 | 217,300.00 | 8,333.33 | 166.67 | 1,275.00 | 9,775.00 |
| 03 | අධ්‍යාපන හෝ වෙනත් සම්මන්ත්‍රණ | 04 | 25,000.00 | 500.00 | 3,825.00 | 29,325.00 | 50,000.00 | 79,325.00 | 6,250.00 | 125.00 | 956.25 | 7,331.25 |
| | | 08 | 35,000.00 | 700.00 | 5,355.00 | 41,055.00 | 50,000.00 | 91,055.00 | 4,375.00 | 87.50 | 669.37 | 5,131.87 |
| 04 | පාසල් ළමුන්ගේ සහභාගීත්වයෙන් පවත්වනු ලබන විවිධ ප්‍රසංග නාට්‍ය දර්ශන | 04 | 20,000.00 | 400.00 | 3,060.00 | 23,460.00 | 30,000.00 | 53,460.00 | 5,000.00 | 100.00 | 765.00 | 5,865.00 |
| | | 08 | 30,000.00 | 600.00 | 4,590.00 | 35,190.00 | 30,000.00 | 65,190.00 | 3,750.00 | 75.00 | 573.75 | 4,398.75 |
| 05 | ළදරු පාසල් උත්සව | 04 | 25,000.00 | 500.00 | 3,825.00 | 29,325.00 | 30,000.00 | 59,325.00 | 6,250.00 | 125.00 | 956.25 | 7,331.25 |
| 06 | රාජ්‍ය ආයතන පවත්වනු ලබන සම්මන්ත්‍රණ/උත්සව | 04 | 20,000.00 | 400.00 | 3,060.00 | 23,460.00 | 30,000.00 | 53,460.00 | 5,000.00 | 100.00 | 765.00 | 5,865.00 |

*සැ. යු.*- සියලුම අයකිරීම්වලදී පෙර පුහුණු කටයුතු සඳහා අදාළ ශාලා ගාස්තුවෙන් අඩක් අයකළ යුතු ය.
(වායු සමීකරණ පහසුකම් රහිත ව පැය 04 කට සීමාවේ.)
* විශේෂ ආරාධිත අමුත්තන්ගේ කාමරය වෙන් කරවා ගැනීමට මුදල රු. 5000.00 + 765.00 + 100.00 = රු. 5,865.00 අය කරනු ලැබේ.

**2020 සතියේ දින**

B ශාලාව

| | විස්තරය | උපරිම පැය | අවම කුලිය (රු.) | NBT 2% (රු.) | VAT 15% (රු.) | මුදල (රු.) | තැන්පත් මුදල (රු.) | මුළු මුදල (රු.) | වැඩිවන පැයකට( රු.) | NBT 2% (රු.) | VAT 15% (රු.) | මුදල (රු.) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | පුහුණු පංති | | | | | | | | | | | |
| | 1. පාසල් | 03 | 5,750 | 115.00 | 879.75 | 6,744.75 | 5,000 | 11,744.75 | 1,916.67 | 38.34 | 293.26 | 2,248.27 |
| | 2. වෙනත් | 03 | 7,750 | 155.00 | 1,185.75 | 9,090.75 | 5,000 | 14,090.75 | 2,583.34 | 51.67 | 395.26 | 3,030.27 |
| | | 01 | 2,583.34 | 51.67 | 395.26 | 3,030.27 | | | | | | |
| 02 | ප්‍රදර්ශන හෝ අලෙවිය | | | | | | | | | | | |
| | 1. පොත් | (8-5) | 9,200 | 184.00 | 1,407.60 | 10,791.60 | 5,000 | 15,791.60 | 1.022.23 | 20.44 | 156.40 | 1,199.07 |
| | 2. වෙනත් | (8-5) | 11,500 | 230.00 | 1,759.50 | 13,489.50 | 5,000 | 18,489.50 | 1,277.78 | 25.56 | 195.50 | 1,498.84 |
| 03 | සම්මන්ත්‍රණ/-දේශන | 06 | 13,800 | 276.00 | 2,111.40 | 16,187.40 | 5,000 | 21,187.40 | 2,300.00 | 46.00 | 351.90 | 2,697.90 |

*සැ. යු.*- සියලුම අයකිරීම්වලදී පෙර පුහුණු කටයුතු සඳහා අදාළ ශාලා ගාස්තුවෙන් අඩක් අයකළ යුතු ය.
(වායු සමීකරණ පහසුකම් රහිත ව)

**2020**

**සතිඅන්ත දින හා රජයේ නිවාඩු දින**

B ශාලාව

| | විස්තරය | උපරිම පැය | අවම කුලිය (රු.) | NBT 2% (රු.) | VAT 15% (රු.) | මුදල (රු.) | තැන්පත් මුදල (රු.) | මුළු මුදල (රු.) | වැඩි වන පැයකට | NBT 2%(රු.) | VAT 15% (රු.) | මුදල (රු.) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | පුහුණු පංති | | | | | | | | | | | |
| | 1. පාසල් | 03 | 6,900.00 | 138.00 | 1,055.70 | 8,093.70 | 5,000 | 13,093.70 | 2,300.00 | 46.00 | 351.90 | 2,697.90 |
| | 2. වෙනත් | 03 | 7,750.00 | 155.00 | 1,185.75 | 9,090.75 | 5,000 | 14,090.75 | 2,583.34 | 51.67 | 395.26 | 3,030.27 |
| | | 01 | 2,583.34 | 51.67 | 395.26 | 3,030.27 | | | | | | |
| 02 | ප්‍රදර්ශන හා අලෙවිය (දිනකට) | | | | | | | | | | | |
| | 1. පොත් | (8-5) | 11,500 | 230.00 | 1,759.50 | 13,489.50 | 5,000 | 18,489.50 | 1,277.78 | 25.56 | 195.50 | 1,498.84 |
| | 2. වෙනත් | (8-5) | 11,500 | 230.00 | 1,759.50 | 13,489.50 | 5,000 | 18,489.50 | 1,277.78 | 25.56 | 195.50 | 1,498.84 |
| 03 | සම්මන්ත්‍රණ/දේශන | 06 | 17250 | 345.00 | 2,639.25 | 20,234.25 | 5,000 | 25,234.25 | 2,875.00 | 57.50 | 439.87 | 3,372.37 |

සැ. යු. සියලුම අයකිරීම්වලදී පෙර පුහුණු කටයුතු සඳහා අදාළ ශාලා ගාස්තුවෙන් අඩක් අයකළ යුතු ය.
(වායු සමීකරණ පහසුකම් රහිත ව)

10-528/1

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.